# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1810/17 - 2013 මැයි මස 13 වැනි සඳුදා - 2013.05.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

### බණ්ඩාරගම ප්‍රාදේශීය සභාවේ සභිකයෙකුගේ ධුරයේ පුරප්පාඩුවක් පිරවීම

පක්ෂ සාමාජිකත්වය අහෝසි වීම හේතු කොට ගෙන බණ්ඩාරගම ප්‍රාදේශීය සභාවේ සභිකයෙකුගේ ධුරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

අජිත් අනුර තලංගමආරච්චි නම් වූ සභිකයා අයත් වන ජනතා විමුක්ති පෙරමුණ නම් වූ පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහක (30) ක කාල පරිච්ඡේදයක් ඇතුළත සභිකයෙකු වශයෙන් තෝරා පත්කර ගන්නා ලදැයි ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු වූ ද, ඒ පක්ෂයට අයත් ඒ බණ්ඩාරගම ප්‍රාදේශීය සභාවේ සභිකයකු වශයෙන් තේරී පත්වීම සඳහා සුදුසුකම් ලත් තැනැත්තකු නාම යෝජනා කිරීමට, මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඒ පුරප්පාඩුව පිරවීම සඳහා සුදුසුකම් ලත් තැනැත්තෙකු වන විලේගොඩ වික්‍රමගේ පත්මසිරි මහතා ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් නම් කරනු ලැබ ඇති හෙයින් ද ;

බණ්ඩාරගම ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරි හැන්නැදිගේ රසික ප්‍රියංග පීරිස් වන මම, විලේගොඩ වික්‍රමගේ පත්මසිරි මහතා බණ්ඩාරගම ප්‍රාදේශීය සභාවේ සභිකයකු වශයෙන් තෝරා පත් කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

රසික පීරිස්,<br>
තේරීම්භාර නිලධාරි,<br>
බණ්ඩාරගම ප්‍රාදේශීය සභාව.

2013 මැයි මස 02 වැනි දින,<br>
මැතිවරණ කාර්යාලය,<br>
කළුතර.

05-790

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

1A - G 17642 — 350 (2013/05)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*